47

Article 13(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2018-3-28 |
|---|---|---|---|

පැමිණිලිකරු : අයි.බී ඒකනායක මයා.
අංක 57. අඹන්පොල.
උඩස්ගිරිය. මාතලේ.

වගඋත්තරකරුවන් : උ.පො.ප ධර්මරත්න මයා.
පොලිස් ස්ථානය.
යටවත්ත.

පැමිණිලි අංකය : **HRC/K/235/16**

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තම පිය උරුමයෙන් නීත්‍යානුකූල ලේඛන සහිතව භුක්ති විඳිනු ලබන ඉඩම සම්බන්ධයෙන් ඒ සඳහා කිසිදු අයිතියක් නොමැති බාහිර පුද්ගලයන් දෙදෙනකු 2016.03.15 දින සිට 2016.04.23 දින වන විට පැමිණිලි කිහිපයක්ම යටවත්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර තිබූ බවත් එහි අවසාන පැමිණිල්ල 2016.04.23 වන දින තමා විසින් එකී ඉඩමේ පුවක්ගස් කිහිපයක් කපමින් සිටින විට සමන් නැමැති පුද්ගලයෙකු 119 ජංගම පොලිස් සේවය වෙත පැමිණිල්ලක් කර ඇති බවත් දක්වා ඇත. එහි නඩුවක් සහිත ඉඩමකට තමා අනවසරයෙන් ඇතුලු වී පුවක් ගස් කපන බවත් එය තහනම් කරන ලෙසත් සඳහන් කර ඇති බවත් ඒ අනුව එහි රාජකාරී භාරව සිටි යටවත්ත පොලිසියේ නිලධාරීන් දෙදෙනකු පැමිණ තමාගේ ලේඛන පරික්ෂා කර බලා සාමය කඩවීමක් සිදුවිය හැකි බැවින් එය නතර කරන ලෙස දන්වන ලද අතර ඒ අනුව තමා එකී කාර්යය නතර කරන ලද බවත් එම නිලධාරීන් පසුදින පැමිණිල්ල විභාග කිරීමට පොලීසියට පැමිණෙන ලෙසද දැන්වූ බවත් ඒ අනුව තමා 2016.04.24 යටවත්ත පොලීසියේ පැමිණිලි විභාගය සඳහා ගිය බවත් සඳහන් කර ඇත. පැමිණිල්ල කළ පුද්ගලයා හා තමා කැඳවා අදාළ ලේඛන පරික්ෂා කර බලා මෙම ඉඩම තමා සතු විය හැකි බැවින් හා මෙතෙක් ඉඩම නිරවුල්ව භුක්ති විඳින බැවින්ද කිසිදු නඩුවක් පවරා නොමැති බැවින්ද මෙම පැමිණිල්ල කළ අයට දේපළ තහනම් කිරීමක් අවශ්‍ය වන්නේ නම් සිවිල් අධිකරණයේ නඩුවක් පවරා ගන්නා ලෙස ස්ථානාධිපති විසින් දැන්වූ බවත් පැමිණිලිකරු සිවිල් නඩුවක් පවරා


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තහනම් නියෝගයක් ගන්නා තෙක් තමාට ඉඩමට ඇතුළු නොවන ලෙස පැවසූ බවත් සඳහන් කර ඇත.

නමුත් ස්ථානාධිපතිවරයාගේ ප්‍රකාශය අසාධාරණ බැවින් එකී ඉඩම මෙතෙක් නීත්‍යානුකූලව භුක්ති විඳින බැවින් හා මෙතෙක් කිසිදු නඩුවක් පවරා නොමැති බැවින් නීත්‍යානුකූලව ස්ථානාධිපතිවරයා විසින් දේපළ තහනම් කරන්නේ නම් තමා ඊට එකඟ වන බවට තමා විසින් පවසන ලද බවත් එහිදී ස්ථානාධිපතිවරයා තමාට එවැනි බලයක් නොමැති බවට පවසමින් නියෝගයක් ගන්නා තෙක් ඉඩමට ඇතුළු නොවන ලෙසට තමාට බැණ තර්ජනය කරන ලද බවත් එසේ වුවත් තමා කපා දමන ලද පුවක්ගස් රැගෙන ඒම සඳහා නීතිමය බාධාවක් නොමැති බැවින් තමා ඉඩමට ගියවිට අදාළ කාන්තාව ඉඩමට විත් ඇයගේ පුතා එනතුරු පුවක්ගස් රැගෙන නොයන ලෙස පැවසූ බවත් ඒ අතරතුර තමා තේක්ක දැව පටවන බවට පැමිණිල්ලක් ලැබී ඇති බව පවසා යටවත්ත පොලීසියේ නිලධාරීන් දෙදෙනකු ඉඩමට පැමිණි බවත් නමුත් තමා පුවක්ගස් පටවා රැගෙන යාමට කටයුතු කළ බැවින් එය අවසන් වන තෙක් ඔවුන් රැඳී සිටි බවත් දක්වා ඇත.

පසුව තමා නිවසට පැමිණ වෙනත් ගමනක් යාමට සිටින විට එනම් 2016.04.24 දින ප.ව 1.03 ට පමණ කාන්තාවක් විසින් තමාගේ ජංගම දුරකථනය වෙත ඇමතුමක් ලබා දෙමින් යටවත්ත පොලීසියේ තමාට විරුද්ධව පැමිණිල්ලක් ලැබී ඇති බැවින් එය විභාග කිරීම සඳහා එදිනම පැමිණෙන ලෙසට දැන්වූ බවත් ඒ අනුව තමා පොලිස් ස්ථානයට ගොස් ප්‍රකාශයක් ලබාගත් අතර එහි සිටි කාන්තා නිලධාරිනිය තමාට තර්ජණය කරමින් ප්‍රකාශ සටහන් කරගත් බවත් ඉන් පසු තමා එයට අත්සන් කළ බවත් පසුව තමා සිරමැදිරිය වෙත ගෙන ගොස් දමන අවස්ථාවේ තමාට විරුද්ධව ඇති චෝදනාව කුමක්ද යන්න ඇසූ බවත් සඳහන් කර ඇත. ප.ව 1.40 - 2.00 ත් අතර කාලයේ සිරභාරයට ගත් බවත් අත්අඩංගුවට ගෙන පැය භාගයකට පමණ පසුව සිවිල් ඇඳුමින් සැරසුනු කාන්තා නිලධාරිනියක් තමාට විරුද්ධව තවත් ඉඩම් ආරවුලක් අනුරුද්ධ යන අය විසින් කර ඇති බැවින් ඒ සඳහා ප්‍රකාශයක් ලබා දෙන ලෙස පැවසූ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එනමුත් තමා සිරමැදිරිය තුළදී ප්‍රකාශ ලබාදීම ප්‍රතික්ශේප කළ බවත් එහිදී ඉහත නිලධාරිනිය "මේකගේ කටවැඩියි. උඹට වඩා ලොක්කෝ අපට හම්බවෙලා තියනවා. උඹට ඕන වෙලාවට කටඋත්තර දෙන්න බෑ. මට ගෙදර යන්න තියනවා. උඹ එළියට එනකන් ඉන්න බෑ" කියා තර්ජණය කර තමාගෙන් එකම කරුණ විමසා පීඩාවට පත්කළ බවත් ඒ අනුව එම කාන්තාව යමක් සටහන් කරගෙන තමාට අත්සන් කරන ලෙස ඉල්ලා සිටි නමුත් තමා එය ප්‍රතික්ෂේප කළ බැවින් තවත් නඩුවක් පවරන බවට තර්ජණය කර තමාගේ බිරිඳගේ අත පැමිණිලි පොත සිර මැදිරියට එවා අත්සන් ගැනීමට බලපෑම් කළ බවත්. දක්වා ඇත.

පසුදින එනම්. 2016.04.25 දින පස්වරුවේ මාතලේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇප ලබා දුන් බවත් එහිදී අධිකරණයට කරුණු ඉදිරිපත් කළ නිලධාරියා තමා අනුරුද්ධ යන අයගේ මවට ඔවුන්ගේ මිදුලට ගොස් තර්ජණය කර ඇති බවට සඳහන් කරන ලද බව දන්වා ඇත. නමුත් තමා එසේ නොකළ බවත් වගඋත්තරකරුවන් විසින් කිසිදු විමර්ශනයකින් තොරව තමාව ද්වේශ සහගත ලෙස අත්අඩංගුවට ගත් බවත් ඒ අනුව තමාගේ කිසිදු වරදක් නොමැතිව විමර්ශනයකින් තොරව

අත්තනෝමතික ලෙස බලය ඉක්මවා කටයුතු කරමින් තමාව අත්අඩංගුවට ගැනීමත්. බැණ තර්ජනය කිරීමෙන් තමාට අපහාස කිරීමත් රාජ්‍ය සේවයේ නියුතු අයකු වන තමාගේ මානව අයිතිවාසිකම් පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුළු නිලධාරීන් විසින් උල්ලංඝනය කිරීමට කටයුතු කර ඇති බැවින් තමාට සිදුවූ පීඩාවන්ට හා අසාධාරණයට වන්දි මුදලක් හා සාධාරණ පරීක්ෂණයක් සිදුකරන ලෙසට මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවීය සැළකිරීම් :-

වගඋත්තර පාර්ශවීය යටවත්ත පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් කොමිසම වෙත ඉදිරිපත් කර ඇති වාර්තා මගින් දන්වා ඇත්තේ. මෙම පැමිණිලිකරු වන අංක 57 අඹන්පොල. උඩස්ගිරිය ලිපිනයේ පදිංචි ඒ.එම්.පී.ජී. නිලන්ත ඉන්දික බණ්ඩාර ඒකනායක යන අයට විරුද්ධව ඉඩම් ආරවුලක් සම්බන්ධව පොලිස් ස්ථානය වෙත පැමිණිලි කිහිපයක් වාර්තා වී තිබූ බවත් එම පැමිණිලි. අංක 15. වැවතැන්න. උඩස්ගිරිය ලිපිනයේ පදිංචි එගොඩ ගෙදර සමන් ප්‍රේමතිලක යන අය විසින් 2016.03.15 දිනැතිව MCR 217/16 යටතේද. 2016.04.23 දිනැතිව MCR 335/16 යටතේද අංක 13/02 වැවතැන්න. උඩස්ගිරිය පදිංචි ඒකනායක මුදියන්සේලාගේ පන්වත්තේ ගෙදර ධම්මික අනුරුද්ධ බංඩාර යන අය විසින් 2016.04.24 වන දින MCR 337/16 යටතේද ඉදිරිපත් කර තිබූ බවට සඳහන් කර ඇත. එම පැමිණිලි වලට අදාළව අපරාධ නීති යටතේ ක්‍රියා කිරීමට නොහැකි නිසා දෙපාර්ශවයට සිවිල් නඩුවක් ගොනුකර ගන්නා ලෙසත්. සාමය කඩවන පරිදි නොහැසිරෙන ලෙසත් උපදෙස් දී සමථයකට පත්කළ බවත්. නැවත 2016.04.23 වන දින ඉහත සඳහන් කළ වැවතැන්න. උඩස්ගිරිය ලිපිනයේ පදිංචි එගොඩ ගෙදර සමන් ප්‍රේමතිලක යන අය විසින් මෙකී පැමිණිල්ල ගොනුකර ඇති අයි.බී ඒකනායක යන අයට විරුද්ධව ආරවුල් ඉඩමක ගස් කැපීම සම්බන්ධව MCR 335/16 යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ බැවින් එය තමා විසින් දෙපාර්ශවය කැඳවා විභාග කර ලේඛන පරීක්ෂා කර මෙම ඉඩමේ අයිතිය සම්බන්ධව තීරණයක් ගැනීමට නොහැකි බැවින් මෙම ලේඛන ඔප්පු ඉදිරිපත් කර සිවිල් අධිකරණයේ නඩුවක් ගොනු කිරීමට උපදෙස් දී සාමයෙන් සිටින ලෙසට හා නැවත ආරවුල් ඇති කර නොගන්නා ලෙසට අවවාද කර සමථයකට පත්කරන ලද බවත්, දක්වා ඇත.

කරුණු එසේ තිබියදී එදිනම එනම් 2016.04.21 දින මෙම පැමිණිලිකරු විසින් ඉහත ඉඩමේ කපාදමා තිබූ පුවක් ගස් කිහිපයක් පැටවීමට යාමේදී එකී ඉඩමට අයිතිවාසිකම් කියා සිටින සිරිවර්ධන අබේරත්න වාසල මුදියන්සේලාගේ ටිකිරි මැණිකේ අරම්පල නැමැති කාන්තාව සමඟ ආරවුලක් ඇති කරගෙන ඇය පදිංචි නිවසේ භූමියට බලහත්කාරයෙන් ඇතුළු වී නිවසේ දොර අසලට ගොස් පරුෂ වචනයෙන් බැණ වැදී තර්ජණය කිරීම සම්බන්ධව පැමිණිල්ලක් කළ බවත් පසුව ඒ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේදී මෙම අයි.බී ඒකනායක යන අය අදාළ නිවසේ භූමියට ඇතුළු වී වයසක කාන්තාවකට බැණ තර්ජණය කිරීමේ චෝදනාව මත ස්ථානයට පැමිණ සිටියදී අත්අඩංගුවට ගත් බවට දක්වා ඇත.

ඉන් අනතුරුව පොලිස් ස්ථානයේ වැඩ බලන ස්ථානාධිපති උ.පො.ප ධර්මරත්න විසින් වැඩිදුර විමර්ශන සිදුකර මෙම සිද්ධිය සාමය කඩවීමක් හෝ මිනීමැරුමක් දක්වා දුරදිග යා හැකි බැවින් විත්තිකරු ද.නී.ස 433. 486 වගන්තියට අදාළ චෝදනා යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් කර ඇති බැවින් 2016.04.24 දින මාතලේ මහේස්ත්‍රාත් නඩු අංක බී 486/16 යටතේ අධිකරණයට ඉදිරිපත් කර පසුව විත්තිකරුට තරයේ අවවාද කර ශරීර ඇප මත මුදා හැර ඇති බවත් මෙම පැමිණිලිකරු විසින් නිවසට අයුතු ලෙස ඇතුල් වී බැණ තර්ජණය කිරීම සම්බන්ධයෙන් වරදට අත්අඩංගුවට ගෙන ඇති බවත් කිසිදු අත්තනෝමතික අත්අඩංගුවට ගැනීමක් සිදුකර නොමැති බවත් දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

1. ඉඩමකට අයුතු ඇතුල්වීම හා බැණ තර්ණය කිරීමේ චෝදනාව යටතේ අත්අඩංගුවට ගැනීමක් සම්බන්ධයෙන් පැමිණිල්ල ඉදිරිපත් කර ඇත.

2. පොලිස් ස්ථානය වෙත පැමිණිල්ල ඉදිරිපත් කර ඇති පැමිණිලිකාරියගේ එනම්. ටිකිරිමැණිකේ මහත්මියගේ ඉඩමට පැමිණිලිකරු විසින් අයුතු ලෙස ඇතුල් වී බැණ තර්ජණය කර ඇති බව වගඋත්තරකරුවන් විසින් සඳහන් කළද. සිද්ධිය සිදුවන අවස්ථාවේ එම ස්ථානයේ සිටි රියදුරු විසින් ලබා දී ඇති ප්‍රකාශයේ පැහැදිලිව සඳහන්ව ඇත්තේ එකී පැමිණිලිකාරිය පුවක් කොට පටවමින් සිටි ස්ථානයට පැමිණි බවත්. ඇයට තර්ජණය කිරීමක් සිදු නොවුනු බවත් පැමිණිලිකරු පොලීසියට පැමිණිලි කළ තැනැත්තියගේ ඉඩමට ඇතුළුවීමක් සිදු නොකළ බවත්ය. ඒ අනුව පැමිණිලිකරු. පොලිස් ස්ථානයේ පැමිණිලි ඉදිරිපත් කර ඇති තැනැත්තියගේ ඉඩමට ඇතුළු වීමක් හෝ තර්ජණය කිරීමක් සිදුකර නොමැති බව නිරීක්ෂණය වේ.

3. පොලිස් ස්ථානය විසින් 2016.04.25 වන දින පැමිණිලිකරුව අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී අදාළ ටිකිරිමැණිකේ මහත්මියගේ ඉඩමට අයුතු ලෙස ඇතුළු වී ඇයට බැණ තර්ජණය කළ බවට කිසිදු සාක්ෂිකරුවෙකු අධිකරණයට ඉදිරිපත් නොකිරීම මඟින් එවැනි සිද්ධියක් සිදුවී නොමැති බව නිරීක්ෂණය වේ.

4. පැමිණිලිකරු විසින් මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත පැමිණිලි කිරීමෙන් පසු වගඋත්තරකරුවන් විසින් ටිකිරිමැණිකේ මහත්මියගෙන් නැවත ප්‍රකාශයක් 2016.05.01 වන දින සටහන් කරගෙන ඇත්තේ අදාළ අත්අඩංගුවට ගැනීම සාධාරණීකරණය කිරීම සඳහා සාක්ෂිකරුවෙකුගේ ප්‍රකාශයක් ඇතුළත් කිරීම සඳහා බව නිරීක්ෂණය වේ. අදාළ ප්‍රකාශය 2016.05.01 දින සටහන්කරගෙන ඇති අතර සාක්ෂිකරු ඔහුගේ ප්‍රකාශයේදී පැමිණිලිකරු පොලිස් ස්ථානයේ පැමිණිලි කළ තැනැත්තියගේ නිවස අසලට ගොස් යමක් පැවසූ නමුත් කියූ දෙය ඔහුට නොඇසුන බව සඳහන් කර ඇත. එම ප්‍රකාශය අනුවද පැමිණිලිකරු විසින් එකී තැනැත්තියට බැන තර්ජණය කළ බවක් නිරීක්ෂණය නොවේ.

5. පැමිණිලිකරුව අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර අදාළ සිද්ධිය සිදුවන අවස්ථාවේදී එම ස්ථානයේ සිටි වාහනයේ රියදුරු. අදාළ ගස් පැටවූ අය හෝ අයුතු ඇතුල්වීම හා තර්ජණය කිරීම පිළිබඳ කිසිදු සාක්ෂිකරුවෙකුගේ ප්‍රකාශයක් නොමැතිව එකී තැනැත්තියගේ පැමිණිල්ල මත පමණක් පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන තිබීම. පොලීසිය වෙත අදාළ තැනැත්තිය විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ල නිසි ලෙස විමර්ශනයක් කර නොමැති බවට තහවුරු කරවන්නක් වන බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකරුට එරෙහිව පොලිස් ස්ථානය වෙත ලැබී ඇති පැමිණිල්ල පිළිබඳව සාධාරණ විමර්ශනයක් සිදුනොකර පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර නඩු පැවරීම මඟින් වගඋත්තර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13(1) වන ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත රු. 15,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

2018.4.27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය, මහනුවර B/